## 07. නිපුණතාව

**බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කනිෂ්ඨ රාජ සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදු සසුනේ චිරස්ථිය උදෙසා කැප කැපවීමෙන් ක්‍රියා කරයි.**

# බුදුරජාණන් වහන්සේගේ ධර්ම චාරිකා හා

# බුදුරජාණන් වහන්සේගේ ධර්මය සමයේ භික්ෂු-භික්ෂුණී ධර්ම දූත සේවා.

**7.1 බුද්ධ කාලයට ධර්මදූත සේවාව පිළිබඳ සමාලෝචනයක යෙදෙයි.**

- **බුදුරජාණන් වහන්සේගේ ධර්ම චාරිකා**

මග - නොමග, කුසල් - අකුසල්, පින් - පව් නොදැක කෙලෙස් බරිත ව ක්‍රියාකරන ජනතාවගේ දෙලොව

යහපත මෙන්ම ආත්ම විමුක්තිය සඳහා මග පෙන්වීම බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ ඒකායන අපේක්ෂාවයි. ප්‍රථම රහත් හැට නම ධර්ම චාරිකාවේ යෙදවූ බුදුරදුන් විවේකීව සුවපහසු ලෙසින් එක් තැනකට වී කල්ගත කිරීමට නොසිතූහ. බුදුරදුන්ගේ ධර්ම චාරිකාවේ යෙදුණහ. උරුවෙල් දනව්වට වඩින අතරතුර වන පියසක ගසක් යට වැඩ සිටින බුදුරදුන්ට විනෝද වීම පිණිස කාන්තාවන්ට සමඟ වන වන උයනට පැමිණි භද්දවග්ගිය කුමාරවරුන් කුමාරවරු තිස් දෙනෙක් මුණ ගැසුණාහ. විනෝද වන අතර ඔවුන් සතු ආභරණ රැගෙන පළාගිය තරුණියන් ගැන බුදුරදුන් ගෙන් විමසීය. අනුන් ගැන සෙවීමට වඩා තමන් ගැන සෙවීම සෙවීමේ වැදගත්කම පැහැදිලි කරමින් දෙසූ දහම් අසා තරුණයෝ ධර්මාවබෝධය ලැබූහ පැවිදි උපසම්පදාව ලබා ගත්හ.

500ක සිසු පිරිසක් සමග පොදු ජනතාවගේ එයට ගෞරවාදරයට පත්ව සිටි උරුවෙල කාෂප නම් ජටිල ආගමික ප්‍රබල නායකයෙකු දමනය කිරීමට බුදුරදුන්ට හැකිවූයේ උරුවෙල චාරිකාව තුළිනි. ජටා මඩුලු දරන, ගිනි දෙවියන් පුදන, ගංගා ආශ්‍රිතව වාසය කරන එම උරුවෙල උරුවෙල කාශ්‍යප දමනය කිරීම පිණිස 1500 ක තරම් ප්‍රාතිහාර්ය පෑමට සිදුවිය. තමන් රහත් යැයි සිතාගෙන නොමඟ ගොස් සිටි උරුවෙල කාශ්‍යප ඇතුළු පන්සියයක් වූ සෙසු පිරිස ඒහි භික්ඛු පැවිද්දෙන් පැවිදි බව ලැබූහ. ඔවුන්ගේ ජටා ගඟේ පාවී යනු දුටු නදී කාශ්‍යප තුන්සීයක  අනුගාමික පිරිස ද විසූ

දෙසියක් පිරිස සමග සිටි ගයා කාශ්‍යප යන තිදෙනාම අනුගාමික 1000 පිරිවර සමග පැවිදි උපසම්පදාව ලබන ලද්දේ බුදුරදුන්ගේ ධර්ම චාරිකාවේ ප්‍රතිඵලයක් ලෙසය.

උරුවෙල් දනව්වේ චාරිකා කිරීමෙන් පසු පොරොන්දුවක් ඉටු කිරීමේ අරමුණ ද ඇතුළුව උරුවෙල කාශ්‍යප දී භික්ෂු පිරිසිදු සමඟ රජගහ නුවරට වැඩම කළහ. නගරයට සමීප ලට්ඨිකවන උද්‍යානයේ බුදුරදුන් ප්‍රධාන භික්ෂූන් පිරිසක් වැඩ සිටින බව බිම්බිසාර රජුට ආරන්චි විය. සිදුහත් බෝසත් සමයේ මගධ රාජ්‍යය අඩක් පාලනයට දුන් නමුත් රාජ්‍ය සම්පත්තියට වඩා සත්‍යය සෙවීමක් පළමුව පළමුවන අරමුණ බව පැවසූ කල්හි සත්‍ය සොයා ගත් පසු තම රාජ්‍යයට වැඩම කරන ලෙස පෙර දවසේ තමන් කළ ඉල්ලීමට අනුව වැඩම කළ බව සිත මෙන් බුදුරදුන් හමුවට රජතුමා පැමිණියේණ ලෙසින් ප්‍රසිද්ධ ව සිටි උරුවෙල කාශ්‍යප ඇතුළු පිරිස දැකීමෙන් රජතුමාට කුතුහලයක් ද ඇතිවිය. බුදුරදුන් ඒ පිළිබඳ දැනගත් අතර රජුගේ සැකය දුරු කරන ලෙස උරුවෙල කාශ්‍යප හිමිට දැනුම් දුන්හ. පෙරහැර පැමෙන් පසු බුදුන්ගේ ශ්‍රී පතුල් අල්ලා වන්දනා කර මා දැන් බුදුන් වහන්සේගේ ශිෂ්‍යයෙක් වෙමි කී පසු රජුගේ පැහැදීම දෙගුණ තෙගුණ විය.

තෙරුවන් සරණ ගිය රජතුමාට දෙසූ දහම් ඇසීමෙන් සෝවාන් තත්වයට පත්වූ අතර බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවනට වේළුවනාරාමය ඉදිකොට පූජා කළේය. ප්‍රථම ආරාම පූජාව ද එය වේ බෞද්ධ භික්ෂූන් රුක්මුල්, ගල්ලෙන්, ගස්

බෙන වැනි ස්ථාන ඇසුරු කළ පිළිවෙත ආරාමික ජීවිතයට පෙළඹී පසු කාලයේ නාලන්දා විශ්ව විද්‍යාලය වැනි අසහාය අධ්‍යාපන මධ්‍යස්ථානය බිහිවීමටද මෙය අනුබලයක් විය. මේ අතරතුර ධර්ම චාරිකාවේ නිරත ව සිටි අස්සජී මහරහතන් වහන්සේට මුණගැසුනු කෝලිත උපතිස්ස පිරිවැජියන් දෙදෙනා බුදුරදුන් වෙත පැමිණ උපසම්පදාව ලැබූහ සම්බුදු සසුනෙහි අග තනතුරු ලැබීමට උන්වහන්සේ පින්වන්ත වූහ.

එදා ප්‍රසිද්ධ වූ කීර්තිමත් ,වූ කරුණා වූ, උගත් බුද්ධිමත් වූ විශාල පිරිසක් බුද්ධ ශ්‍රාවකයන් පිරිසට තවදුරටත් බුදු සසුනේ ව්‍යාප්තියට අනුබලයක් විය. ලාභ/ කීර්ති/ ප්‍රශංසා / අනපේක්ෂිතව /පරාර්ථකාමීව භික්ෂූන් මෙන් ම බුදු රදුන් දිනෙන් දිනම/ ගමෙන් ගමට/ පුරවරයෙන් පුරවරට/ ජනපදයෙන් ජනපදයට වැඩම කිරීම නිසාම නවතම දහම වටා සිය දහසක් පිරිස ඒකරාශී වන්නට වූහ.

බුදුරදුන්ගේ ආදර්ශමත් ක්‍රියා පිළිවෙත රජවරු මැති ඇමතිවරු සිටුවරු මෙන්ම පොදු ජනතාවගේ විශේෂ පිළිගැනීමට ලක් වූ දහම වූයේ බුදු දහමයි. බුදුරදුන් සතු සුවිශේෂ නවඅරහාදි බුදු ගුණ නිසා ද උන් වහන්සේ වෙත සිය දහස් ගණනින් ධනවත් තරුණයන් පැමිණ පැවිදි බව ලැබීය. කෙතරම් දුරට වර්ධනය වී ද යන්න ප්‍රකට

වන අවස්ථාවක් නම් අන්‍යාගමිකයන් ලැබූ චෝදනාවන් ය.

"බුදුරදුන් තරුණයන් සසුන්ගත කිරීම නිසා තරුණියන් බිරින්දෑවරුන් තනිවී අසරණ වෙති." "ශ්‍රමණ භවත් ගෞතමයන් කුල දූෂණය කරන්නෙකි." "පවුල් කඩාකප්පල් කරන්නෙකි." ආදි වශයෙන් එක චෝදනා හමුවේ අකම්පිත ව ක්‍රියා කිරීමේ පිළිවෙත තවදුරටත් සසුනේ ව්‍යාප්තියට අනුබලයක් වූ බව පෙනේ.

- **බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේදී සිදුවූ භික්ෂු භික්ෂුනී ධර්ම දූතසේවා**

විවිධ ආගමික, දාර්ශනික චින්තාවන්ගෙන් ගහණ වූ සමයක බුදුරදුන් ලොව පහළ විය. සමකාලීන භාරතීයන්ගේ ගතානුගතික ආගමික ඉගැන්වීම් ක්‍රමයකි. අනුසෝතගාමි ඉගැන්වීම් අතර පටිසෝතගාමි දහමකි. ගතානුගතිකත්වය, ආදානග්‍රාහිත්වය ඇගයුම් කළ ඉගැන්වීම් අතර විචාරශීලි බුද්ධි ගෝචර දහමකි. ප්‍රාඥවන්තයන්ටම ගෝචර වන්නකි. මෙබදු ලක්ෂණවලින් සමන්විත බුදු දහම හඳුන්වා දුන් බුදුරදුන් භාරතයේ පහළ වන ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා කිසිදු පහසුකමක් නොපැවතුණි. එබදු පසුබිමක නවතම දහමක් වූ බුදුදහම හඳුන්වා දීමෙහි ලා මූලික වශයෙන් අනුබලයක් වූයේ **සිව්වනක් පිරිසයි.**

බුදු රදුන් හඳුන්වා දෙන ලද නවතම දහම අසා පැහැදිමට පත් අනුගාමික පිරිස සිව්වනක් පිරිස **සිව්වනක් පිරිස** ලෙස හඳුන්වයි. සාසනයේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාකල පිරිස වන්නේ මේ පිරිසයි.

1. භික්ෂු සමාජය
2. භික්ෂුනී සමාජය
3. උපාසක සමාජය
4. උපාසිකා සමාජය යන්නයි.

සිව්වනක් පිරිස අතරින් ශාසනය වෙනුවෙන් කැප කළ දිවිපෙවෙතේ කින් යුත් පිරිස පැවිදි සමාජයයි. පැවිදි සමාජය අතුරෙන් ද මූලික වනුයේ භික්ෂු සමාජයයි. බුදුරදුන්ගේ ප්‍රථම ශ්‍රාවක පිරිස පස්වග මහණුන් ය. ක්‍රමයෙන් සංඝ සමාජය විකාශනය විය රහතුන් සැට නමක් වූ පසු ඔවුන් අමතා

**" චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත් අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං මා ඒකේන ඒකේන දේසේත අගමිත්ථ දේසේත  භික්ඛවේ ධම්මා ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං සාත්ථං සංඛ්‍යංජනං කේවළ පරිපුණ්ණං සංබලිඛිතං පරිසුද්ධ බ්‍රහ්ම චරියං පකාසේත. "**

යනුවෙන් **" දෙව් මිනිසුන් සහිත ලෝකයා ගේ හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන මුල මැද අග යන තුන් ස්ථානයන්හි ම යහපත් වූ ධර්මය දේශනා කරන්න."** යනුවෙන් උපදෙස් දුන්නාහ විමුක්ති ලාභය භික්ෂූන්ට

පැවරුණ පළමු කාර්යය වනුයේ පරාර්ථ සේවය නියැලෙමින් ධර්ම මාර්ගය පෙන්වා දීමයි.

**" ගිහින මුප කරොන්තානන්**

**නිච්ච මාමාස දානතෝ**

**කරෝථ ධම්මදානේන**

**තේසං පච්චුපකාරකං"**

**"සිව්පසයෙන් උපස්ථාන කරන ගිහි ජනතාව වෙනුවෙන් භික්ෂූන් වහන්සේ ධර්ම දානයෙන් ප්‍රති උපකාර කළ යුතු බව"** මෙකී ගාථාවෙන් පෙන්වා දෙයි.

ප්‍රථම රහත් හැට නම ධර්මදූත කාර්ය යෙදූ බුදුන් වහන්සේ උරුවෙල් දනව්වේ විසූ උරුවෙල කාශ්‍යප හා ඔවුන්ගේ අනුගාමිකයන් පන්සියයක් දෙනා ද ගයා කාශ්‍යප ඔවුන්ගේ අනුගාමිකයන් 300 ද නදී කාශ්‍යප ඔවුන්ගේ අනුගාමිකයන් දේශීය ද ඇතුළු ජටිලයන් 1003 ධර්මය දේශනා කර ඒ සියලුම දෙනා වහන්සේලා ද ධර්මදූත ධර්ම දූත සේවා කාර්ය යෙදවූ බව සඳහන් වේ.මෙබඳු උපදෙස් වලින් උපදෙස්වලින් ශික්ෂිත වූ භික්ෂූහු ගම් නියම් ගම් නියම්ගම් ජනපද කඳු හෙල් බැවුම් ගිරි ශිඛර ආදි ස්ථාන තරණය කරමින් ලාභ කීර්තිය ආදිය අනපේක්ෂිතව මරනා මරණාසන්න තෙක්ම සේවයෙහි නියැලුණහ ප්‍රථම රහත් හැට නම අතර අස්සජි මහරහතන් වහන්සේ ධර්ම චාරිකාවේ

යෙදෙන කල්හි සංජය නම් පරිබ්‍රාජකයා ගේ අනුගාමිකයකු වූ උපතිස්ස හමුවිය පැවැත්වූ පැවැත් වූ සාකච්ඡාවෙන් පසු අස්සජි හිමි

**"යේ ධම්මා හේතුප්පබවා**

**තේසං හේතුං තථාගතෝ ආහ**

**තේසං ච යෝ නිරෝධෝ**

**ඒවං වාදී මහා සමණෝ"**

යනුවෙන් මුළු බුද්ධ වචනය ම අඩංගු කොට දේශනා කළ ගාථාවේ මුල් දෙපදය අසන්න උපතිස්ස සෝවාන් විය. පසු තම මිත්‍රයාගේ උපතිස්ස සියලු තොරතුරු දැනුම් දුන්නේ තමන් ඇසූ ගාථාව තම මිත්‍රයාට ප්‍රකාශ කරනවාත් සමගම මිත්‍රයා වූ කෝලිත සෝවාන් විය. ධර්මාවබෝධය ලැබූ ඔහු සංජය පිරිවැජියා සමඟ විසූ අනුගාමික 250 පමණ පිරිස සමඟ වේළුවනාරාමය වැඩ සිටි බුදුරදුන් සොයා ගෙන ගියේය. දහම් අසා රහත් වූහ සැරියුත් මුගලන් නමින් පැවිදි වූ ඔවුහු අග්‍ර ශ්‍රාවක තනතුරු වලින්ද පිදුම් ලැබූහ. අස්සජි හිමිගේ චාරිකාවන් නිසා ප්‍රථම වරට දෙසිය පනස් දෙනෙක් ධර්මාවබෝධය සලසා ගත්හ. මෙම කාලයේම දුරුතු පුර පසළොස්වක පොහෝ දින ලක්දිව මහවැලි ගංගා තලාවේ මහියංගනය මහන වනෝද්‍යානයෙහි පැවති යක්ෂ සමාගමෙ වැඩම කළ බුදුරදුන් ඔවුන් හට ද ධර්මාවබෝධය ලබා දුනි. එකල ඉතා දක්ෂ වාදකයෙක් ලෙස ප්‍රසිද්ධව සිටි සච්චක අස්සජි හිමි විසල්පුර යෙදී පැවැත්වූ සාකච්ඡාවෙන් පසු

සච්චක බුදුරදුන් හමුවීමට ගියේය. දහම් අසා අනුගාමිකයෙකු විය. සක වැන්නවුන් තෙරුවන් සරණ යාම බුදු සමයේ ව්‍යාප්තිය ඉන් මහත් අනුබලයකි. චූල සච්චක චූලසච්චක සූත්‍රයෙහි සඳහන් පුවත වාර්තා වේ.

බිම්බිසාර රජු මුණ ගැසීමට රජගහ නුවරට වැඩම කළ බුදුරදුන් ලට්ඨි නම් ස්ථානයකදී රජු ඇතුළු පිරිසට ධර්මාවබෝධය ලබා දුන්නහ. එහිදී රජු විසින් බුදුරදුන් ඇතුළු පිරිස වේළුවනාරාමය පූජා කළ අතර එය බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව යි. මග දැන් පිටත් වූ බුදුරදුන් අනතුරුව රජගහනුවරයෙන් කිඹුල්වතට වැඩි සේක. ශාක්‍යයන් බුදුපාමොක් මහ සඟනට නිග්‍රෝධාරාමයේ පූජා කළේය. මෙහිදී බුදුරජාණන් වහන්සේ ශාක්‍යයන්ගේ මානය දුරු කිරීමට ප්‍රාතිහාර්ය කළ අතර කිඹුල්වත්පුරට වැඩම කොට නන්ද රාහුල කුමරු ඇතුළු ශාක්‍යන් පැවිදි උපසම්පදා කර අභිවෘද්ධියට කාර්යය යෙදූනහ.  එකල සමාජය තුළ සිදු වූ කෙරුණු ඉගැන්වීම් නිසා පීඩාවට පත්ව සිටි සුනීත ,සෝපාක, රජ්ජුමාලා වැන්නවුන් බුද්ධ ශාසනයේ ව්‍යාප්තිය සමග විශාල ලෙස බුදු සසුනේ පැවිදිව ධර්මදූත කාර්ය යෙදුණාහ.

කෝසල, බිම්බිසාර, සුද්ධෝදන ආදී රජවරුන්ගේ අනුග්‍රහය ද අනේ අනේපිඬු, බරණැස් සිටු ,මිගාර වැනි සිටුවරුන් ගේ අම්ල දායකත්වය ද කෝසල ,මල්ලිකා, විශාකා වැනි උපාසකවරුන්ගේ දායකත්වය ද එලෙසින් ලැබුනේ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් වශයෙනි.

බුදුරදුන්ගේ දකුණු ශ්‍රාවක සැරියුත් තෙරුන් සිව්වනක් පිරිස අතර පමණක් නොව අන්‍ය ආගමිකයන්ගේ පවා කීර්තියට ගෞරවයට පත් භික්ෂුවකි. භික්ෂූන් අතර කල්‍යාණ මිත්‍රයෙක් ලෙස ඔවුන්ගේ අඩුපාඩු සොයමින් පරාර්ථ සේවය පිණිස ම කැප වී ක්‍රියා කළ සැරියුත් හිමි තම සහෝදර සහෝදරියන් ධර්ම මාර්ගයට ගැනීම පිණිස විශිෂ්ට සේවයක් සලසා ඇත. චාලා , උපචාලා , පිසූපචාලා යන සොයුරියන් මෙහෙනි සසුනට ඇතුළත් කරවනු ලැබිණි. භික්ෂුණිහු භික්ෂුණී ශාසනය ඉතා ප්‍රකට තත්ත්වයකට පත්වූහ විශාල සේවයක්මේ හරහා සැලසූහ. සහෝදරයෙක්ද පැවිදි කර වූ අතර බාලම සොහොයුරා මැණියන්ගේ බලපෑම මත නිවසට වී සිටියේය. සැරියුත් හිමි සූක්ෂම අයුරින් ක්‍රියා පිළිවෙතකින් මිත්‍යා ලබ්ධිකව සිටි තම නිවැසියන් මෙන්ම පිරිනිවන් පෑමට පෙර මැණියන්ද බවද උපාසිකාවක් බවට පත් කිරීමට සමත් වූහ. උගත් බුද්ධිමත් බ්‍රාහ්මණ පඬිවරුන් පැවිදි බව ලැබීමට සැරියුත් හිමියන් විශේෂ බලපාන ලැබිණ. උගත් බුද්ධිමත් පිරිසක් පැවිදි වීම ශාසනයේ උන්නතියට බෙහෙවින් බලපානු ලැබෙන අසූ මහා ශ්‍රාවකයන් අතර විශේෂ තනතුර ලැබූ විශාල පිරිසක් බ්‍රහ්මණ වංශිකයන් වීම විශේෂ ලක්ෂණයකි. සැරියුත් හිමියන් බිහි කළ ශිෂ්‍ය පරම්පරාවට පලවන පළ වන සංගායනාවෙන් පසු මජ්ඣිම නිකාය භාර කළ බව ද පෙන්වා දෙයි.

වමත්සම මුගලන් වහන්සේ වැඩි බලයෙන් විශිෂ්ට සේවයක් සලසා ඇති අයුරු දැකිය හැක. උන්වහන්සේ

වරින්වර දෙව්ලොවට වැඩම කළහ. දෙවිවරු සමඟ සාකච්ඡා කළහ. දෙව් සැප ලැබීමට කරන ලද පුණ්‍ය කර්ම ගැන අසා දැනගෙන එම තොරතුරු මනුෂ්‍ය ලෝකයේදී විග්‍රහ කළහ. පින් දහම් කිරීම , පින්දහම් කිරීමේ ආදීනව පෙන්වා දීම තුළින් බොහෝ ජනතාව දාන ,සීල, භාවනා ආදී පුණ්‍ය ක්‍රියාවන්හි නියැලීමට පෙළඹුණහ. ඍර්ධි බලයෙන් අපායෙදි සැරිසරමින් අපා දුක් විඳින සත්ත්වයන් සම තොරතුරු විමසීමෙන් එම තොරතුරු විග්‍රහ කරමින් පස් පව් දස අකුසල් ආදී පාප ක්‍රියාවන් කිරීමේ භයානක කම පෙන්වා දුන්හ. එම විස්තරය අසන ජනතාව යාගහෝම වැනි හිංසාත්මක ක්‍රියාවලින් වැලකී බුදුසමයට අනුරූපී ව ක්‍රියා කිරීමට පෙළඹුණහ. මෙසේ මුගලන් හිමි දෙව්ලොව හා සතර අපායන්හි සැරිසරමින් කරන ලද විස්තර නිසා අන්‍යාගමිකයෝ විශාල වශයෙන් බුදුදහම බුදුදහම වැළඳ ගැනීමට පෙලඹුණහ. මේ පිළිවෙත නිසා අන්‍යාගමිකයින්ට අනුගාමිකයෝ අඩු වූහ. ලාභ සත්කාර අඩුවිය. ගරු බුහුමන් අඩුවිය. එනිසාම වෛර සහගතව ක්‍රියා සහගත ව ක්‍රියා කළ තීර්ථකයෝ මුදල් යොදවා දාමරිකයින් ලවා මුගලන් හිමි මරා දැමීමට කටයුතු යෙදූහ. ඍර්ධි බලයෙන් පලා ගොස් ජීවිතය රැක ගත් නමුත් කර්ම විපාකයන් බලපා ඇති බැවින් තෙවන වාරය එතැනටම වී සිටියහ. දාමරික පිරිස දඬු මුගුරුවලින් අමානුෂික ලෙස පහර දුන්හ.

බුදුරදුන් බෙහෙවින් සමාන වූ රූප කාය සම්පත්තිය යුක්තව සිටි මහාකාශ්‍යප මහරහතන් වහන්සේ කෙළෙස් ධුතාංගධාරී භික්ෂුවක් වශයෙන් එක ස්ථානයක දෙදිනක්

වැඩම නොසිටින  අතර දවසන් දවස විවිධ පළාත් පලාත් වල සංචාරය කළහ. එමගින් බුදු සසුනේ ප්‍රචාරයට විශාල අනුබලයක් ලැබුනහ. පිණ්ඩපාත යෙදී සිටියදී දිනක් සිදු වූ සිදුවීමක් නිසා වනගත වූ අතර බුදුරදුන් පිරිනිවන් පෑමෙන් පසු නගරයට වැඩම කොට ආදාහන කටයුතු සිදු කළහ. ශාසනධාරී ලෙස ක්‍රියා කළහ. දුසිල් අධර්මවාදී මහණුන්ගෙන් සසුන රැක ගැනීමට බුදුරදුන් පිරිනිවන් පා මාස තුනකට පසු සංගායනාවක් කිරීමට මුලිකවම ක්‍රියා කළහ. ථෙරවාදී බුදු දහම චිරස්ථායි කිරීමට විශිෂ්ට සේවයක් සැලසූහ. බුද්ධ වචනය විනය පිටකය, සූත්‍ර පිටකය ආදී ලෙස වර්ග කළ අතර කට පාඩමින් පවත්වාගෙන යාමට එකෙන් එක කොටස් භික්ෂූන්ට භාරදුන්නහ. මහා කාශ්‍යප හිමි සංයුත්ත නිකාය භාරව ක්‍රියා කළහ.

ගිහි පැවිදි බෞද්ධ අබෞද්ධ කවුරුත් අතරේ අතර බෙහෙවින් ජනප්‍රිය ම ප්‍රසිද්ධව සිටි ආනන්ද හිමියන්ගෙන් ශාසනික සමෘද්ධිය පිණිස උසස් මෙහෙයක් සැලසුන බව පෙනේ. **ධර්ම භාණ්ඩාගාරික වශයෙන් ද, බුදුරදුන්ගේ නිත්‍ය උපස්ථායකයා වශයෙන් ද ක්‍රියා කළ ආනන්ද හිමියෝ ධාරණ ඇත්ත උන් අතර ද  අග්‍රස්ථානය ලැබූහ. විශේෂ තනතුරු පහත දැරූ උන්වහන්සේ පොදු ජනතා ප්‍රසාදයට ලක්ව ක්‍රියා කළ භික්ෂුවකි. ආනන්ද බෝධිය පිහිටුවීමට මූලිකව කටයුතු කළ අතර මෙහෙණි සසුන ඇරඹීම සඳහා බුදුරදුන් පොළඹවන ලද්දේ ද ආනන්ද හිමියන් විසිනි.** බුදුරදුන් මල්ල ජනපදයට වැඩම කළ අවස්ථාවේ සෑම රජෙක්ම උන්වහන්සේ හමුවිය යුතු බවත් නො එසේ නම් එසේනම් දඩ ගසන බවත් දැනුම් දුන්පසු මල්ල රජු න් දඩ

ගෙවීමෙන් වැලකී සිටීමට බුදුරදුන් හමුවීමට පැමිණියහ. ඒ බව දැනගත් ආනන්ද හිමියන් ඔවුන්ට ශ්‍රද්ධාව ඇති වන අයුරින් දහම් දෙසන ලෙස බුදුරජුන්ගෙන් අයැද සිටියේය. ඒ අනුව පැහැදීමට පත් වූ මල්ල රජදරුවන් සසුනේ උන්නතියට විශේෂ අනුග්‍රහයක් දැක් වූහ. රාජ බිසෝවරුන්ට දහම් දෙසීම ද විශේෂ කාර්යයකි. පළමුවන ධර්ම සංගායනාව අවස්ථාවේ සූත්‍ර පිටකය භාරව ක්‍රියා කළහ. දීඝ නිකාය කටපාඩමින් පවත්වාගෙන යාමට ආනන්ද හිමියන් ප්‍රධාන ශිෂ්‍ය පිරිස ක්‍රියා ක්‍රියාකළහ. කපුටකු එළවා ගත හැකි තරමේ වයසේ කුඩා ළමුන් පවා පැවති කිරීමට බුදුරජාණන් අනුමැතිය දුන්නේ ආනන්ද හිමිගේ ඉල්ලීම් අනුවය.

කිසිදු පහසුකමක් නැති දුෂ්කර රළු කටුක හූ විෂමතාවය කින් යුක්ත වූ ඉතා දරුණු මිනිසුන් ගෙන් යුක්ත සුනාපරන්ථය වැනි ප්‍රදේශවලින් පවා භික්ෂූහු ධර්ම ප්‍රචාරයෙහි නියැලුණහ. එම ප්‍රදේශය චාරිකාවේ යෙදීමට පෙරමුණ ගත් **පුණ්ණ හිමියන්ගේ** ඉවසීමේ ගුණය බුදුරදුන්ගේ විශේෂ ප්‍රසාදයට ලක් විය.

අන්‍යාගමිකයන් දාර්ශනිකයන් සමග ගැටෙමින් පරමත ඛණ්ඩනය කොට තම මතය ස්ථාපිත කරමින් වාද වාද විවාද පැවැත්වීමෙන් භික්ෂූන් සලසන ලද සේවය උදාරය. වාදයෙන් ජයගත් පක්ෂයට පොදු ජනතාවගේ අනුකූලතාවය ද ලැබීම එකල පැවති පිළිවෙතයි. ඒ අනුව බෞද්ධ භික්ෂූන් අන්‍යාගමිකයන් සමග වාද විවාද තර්ක විතර්ක කරමින් බුදු දහමේ හරවත් බව ප්‍රකට කරවූහ. **පිණ්ඩෝල භාරද්වාජ හිමි**

**දක්ෂතම වාද කරුවකු ලෙස ප්‍රසිද්ධියට පත් භික්ෂුවකි. දක්ෂවුන් අගතනතුර ලැබීය. මහා කච්චායන තෙරුන් කෙටියෙන් කී දෙය සවිස්තරාත්මක ව විග්‍රහ කිරීමේ දක්ෂයකු විය. උපසේන හිමි අන්‍යයන්ගේ ප්‍රසාදය දිනාගැනීමට සමත්වූ භික්ෂුවයි. විචිත්‍ර කථිකයන් අතර කුමාර කස්සප හිමි අග්‍රස්ථ විය.** අසූ මහා ශ්‍රාවකයන් සාසනය අභිවෘද්ධියට බෙහෙවින් ක්‍රියා කළ පිරිසකි **විනයධර උපාලි** හිමියෝ ප්‍රථම සංගායනාවේදී විශිෂ්ට විශිෂ්ට සේවයක් සලසන ලද භික්ෂුව.කි **සුභූති රේවත සීවලී රට්ඨපාල දඹ මල්ල භාග්‍යය** වැනි මහරහතන් මහා රහතන් වහන්සේලා සසුන වෙනුවෙන් ඇපකැපවී කරන ලද සේවාවන් නිසාම බුදු දහම භාරතීයයන් අතර ජනප්‍රිය වූ බව පෙනේ.

භික්ෂූන්ගෙන් මෙන්ම භික්ෂුණීන් වහන්සේලාගේ ද ශාසනයේ උන්නතිය වෙනුවෙන් විශාල මෙහෙයක් සිදු ව ඇත. භික්ෂුණී ශාසනයේ ඇරඹීම මූලිකව ක්‍රියා කළ **මහා ප්‍රජාපතී ගෝතමී අවුරුදු එකසිය විස්සක්** සසුන වෙනුවෙන් සේවය කොට පිරිනිවන් පෑ භික්ෂුණිය **භද්දකච්චායනා (රාහුල මාතා ), ඛේමා, උප්පලවණ්ණා, ධම්මදින්නා** දී භික්ෂුණීන් මහජන ගෞරවාදරය දිනා ගනිමින් ක්‍රියා කළහ. බුදුරදුන්ගේ විශේෂ තනතුරුවලින් ද පිදුම් ලැබූහ. **නන්දා, සකුලා, කිසාගෝතම, සිඟාල මාතා, පටාචාරා, සෝමා** වැනි භික්ෂුණීහුද සදහම් චාරිකාවේ යෙදුණහ. අනුගාමික පිරිස් බිහි කළහ. එලෙස බුදු දහම කෙරෙහි ජනතා ප්‍රසාදය ඇති කිරීමෙන් ඔවුන්ට සමත් විය.

ශාසනයේ උන්නතියට දායකත්වය දැක්වූ දායක දායිකාවන්ගේ ද විශේෂණ බලයක් ලැබී ඇත. බුදුරදුන් කෙරෙහි පැහැදී සිට **මගධාධිපති බිම්බිසාර රජු , කෝසලයේ පසේනදී කොසොල්, වත්සයේ උදේනි රජු, අවන්තියේ චන්ඩ පජ්ජෝත රජු ආදීන්ද අජාසත්ත, මල්ල, කෝලිය, භූලී, විධූඨක මල්ලරෝජ** වැනි රජවරුන් විහාර ආරාම ඉදි කරවා දීමෙන්ද සිවුපසයෙන් භික්ෂූන්ට සංග්‍රහ කිරීමෙන් ද අනුග්‍රහය දක්වා ඇත. **අනේපිඬු සිටුතුමා ප්‍රධාන දායකයා** ලෙස ද **විශාකා ප්‍රධාන දායිකාව** ලෙසද බුදු සසුන කෙරෙහි ඉමහත් භක්තියකින් කටයුතු කර ඇත. **ජේතවනාරාම, පූර්වාරාමය, රාජකාරාමය, සෝසිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය** වැනි ආරාම එබඳු දැහැටි උවැසි උවැසියන් විසින් සාදා දෙන ආරාම වේ. **ඛුජ්ජුත්තරා, සාමාවති, උත්තරා, ජෝතිය, ජටිල, මෙණ්ඩක, මච්ඡරිය ,කෝසිය** වැන්නවුන්ද දක්වන ලද අනුග්‍රහය හේතුකොටගෙන බුදු දහම භාරතය යන සියලු ආගම් අභිබවා ප්‍රචලිත විය.

බුදුරජාණන් බොහෝ අවස්ථාවල දී සූත්‍රදේශනා අවසානයේ දී ධර්ම දේශනා ශ්‍රවණය කළ ශ්‍රාවක පිරිස් මෙලෙස අගය කර ඇත.

**" අභික්ඛන්තං භෝ ගෝතම අභික්ඛන්තං භෝ ගෝතම සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය"**

ලෙස බොහෝ පිරිස් යනුවෙන් පවසා බොහෝ දෙනා ධර්මාවබෝධය ලබා ගැන බුදු සමය වැළඳ ගත්හ. මේ අනුශාසන සමෘද්ධියට සිව්වනක් පිරිස ගෙන් ලැබුණු අනුග්‍රහය ඇති මහත්ය.

*සැකසුම -: පී.ඩබ්ලිව්. ගයානි චමිලා නන්දසේන*

*ජේසු බිලින්දාගේ කන්‍යාරාමය ජාතික පාසල.*